# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1816/34 - 2013 ජුනි මස 28 වැනි සිකුරාදා - 2013.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය :-2/EC/GEZ/2013.

**සංගණන ආඥාපනත (143 අධිකාරය)**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013 වර්ෂයේ මාර්තු මස 25 වැනි දින හා අංක 1803/1 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද ආඥාවෙන්, 2013/2014 වර්ෂවලදී සිදු කළ යුතු යැයි නියමිත ආර්ථික සංගණනය, අධිකාරීකරණය කිරීම පිණිස ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් දොන් චන්ද්‍රසිරි අබේරත්න ගුණවර්ධන මහතා සංගණන අධිකාරී වශයෙන් සංගණන ආඥාපනතේ (143 අධිකාරය) 3 වැනි වගන්තිය යටතේ ගරු ජනාධිපතිතුමා හා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පත් කරන ලදී.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

කොළඹ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

07 - 345/1

---

මගේ අංකය :-2/EC/GEZ/2013.

**සංගණන ආඥාපනත (143 වැනි පරිච්ඡේදය)**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1803/1 හා 2013 මාර්තු මස 25 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ ආඥාවෙන්, 2013/2014 වර්ෂවලදී පැවැත්වීමට නියම කර ඇති ආර්ථික සංගණනය පැවැත්වීම සඳහා මෙහි උපලේඛන I හි සඳහන් නිලධාරීන් නියෝජ්‍ය සංගණන අධිකාරීන් වශයෙන් ද මෙහි උපලේඛන II හී සඳහන් නිලධාරීන් සහකාර සංගණන අධිකාරී වශයෙන් ද සංගණන ආඥාපනතේ (143 වැනි පරිච්ඡේදය) 4 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් පත් කොට ඇත.

උපලේඛන I

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සියලුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, සියලුම අධ්‍යක්ෂවරුන් හා සියලුම නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්.

1A - PG 001664 — 2310 (2013/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛන II

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සියලුම ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරුන් හා සියලුම සංඛ්‍යාලේඛනඥවරුන්.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

කොළඹ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

07 - 345/2

---

මගේ අංකය :-2/EC/GEZ/2013.

**සංගණන ආඥාපනත (143 වැනි පරිච්ඡේදය)**

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් සංගණන ආඥාපනතේ (143 වැනි පරිච්ඡේදයේ) 6, 7 හා 9 වන වගන්ති අනුව පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් සෑම නිලධාරියෙකුම තමාගේ සාමාන්‍ය රාජකාරි වලට අතිරේක වශයෙන් ආර්ථික සංගණනයේ 2 වැනි තීරුවේ සඳහන් තනතුරුවලට 3 වැනි තීරුවේ සඳහන් රාජකාරි බල ප්‍රදේශය වෙනුවෙන් පත් කර ඇත.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

කොළඹ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

| *1 වැනි තීරුව*<br>*ස්ථිර තනතුර* | *2 වැනි තීරුව*<br>*සංගණන තනතුර* | *3 වැනි තීරුව*<br>*රාජකාරි බල ප්‍රදේශය* |
|---|---|---|
| 1. කොමසාරිස් ජනරාල්<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | සංගණන කොමසාරිස් | ශ්‍රී ලංකාව |
| 2. අධ්‍යක්ෂ ජනරාල්<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | සංගණන කොමසාරිස් | ශ්‍රී ලංකාව |
| 3. අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | සංගණන කොමසාරිස් | ශ්‍රී ලංකාව |
| 4. දිස්ත්‍රික් ලේකම්/දිසාපති | සංගණන කොමසාරිස් | දිස්ත්‍රික්කය |
| 5. අතිරේක දිස්ත්‍රික් ලේකම්/<br>අතිරේක දිසාපති | නියෝජ්‍ය සංගණන කොමසාරිස් | දිස්ත්‍රික්කය |
| 6. සහකාර දිස්ත්‍රික් ලේකම් | සහකාර සංගණන කොමසාරිස් | දිස්ත්‍රික්කය |
| 7. කෘෂිකර්ම අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | නියෝජ්‍ය සංගණන කොමසාරිස් | දිස්ත්‍රික්කය |

උපලේඛනය (සම්බන්ධිතයි)

| *1 වැනි තීරුව ස්ථිර තනතුර* | *2 වැනි තීරුව සංගණන තනතුර* | *3 වැනි තීරුව රාජකාරි බල ප්‍රදේශය* |
|---|---|---|
| 8. නියෝජ්‍ය/සහකාර කොමසාරිස් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | නියෝජ්‍ය සංගණන කොමසාරිස් | දිස්ත්‍රික්කය |
| 9. නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | නියෝජ්‍ය සංගණන කොමසාරිස් | දිස්ත්‍රික්කය |
| 10. ප්‍රාදේශීය ලේකම්/උප දිසාපති | නියෝජ්‍ය සංගණන කොමසාරිස් | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය/ උපදිසාපති කොට්ඨාසය |
| 11. නේවාසික ව්‍යාපාර කළමනාකරු | නියෝජ්‍ය සංගණන කොමසාරිස් | මහවැලි කලාපය |
| 12. සහකාර ප්‍රාදේශීය ලේකම් | සහකාර සංගණන කොමසාරිස් | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |

ඉහත තනතුරු වලට අදාළ නිලධාරීන් සංගණන රාජකාරි කාලය තුළ විශ්‍රාම යාම/ස්ථාන මාරු ලැබීම/ තනතුරු පුරප්පාඩු වීම හේතුවෙන් ආසන්නතම උසස් නිලධාරියා විසින් පත්කරනු ලැබූ නිලධාරියෙකු සංගණන රාජකාරි ඉටු කිරීමට බැඳී සිටී.

එසේම දැනටමත් පුරප්පාඩු වූ තනතුරක් සඳහා සංගණන රාජකාරි ආවරණය කිරීම පිණිස නිලධාරියෙකු පත් කර ඇති විට අදාළ තනතුර සඳහා ස්ථිර නිලධාරියා පැමිණියද, සංගණන රාජකාරි එතෙක් ආවරණය කළ නිලධාරියා විසින්ම එම රාජකාරි ඉදිරියටත් කරගෙන යායුතු වේ.

07 - 345/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.